# නූතන ගීතය තරුණ මනස කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් (2000 - 2014 ශ්‍රී ලාංකේය ගීත 20ක් ඇසුරින්)

ජී. ආර්. එන්. ගුණරත්න[1]

## හැඳින්වීම

කලාව විවෘත්ත ප්‍රපංචයක් නොවේ. එය ආර්ථික, දේශපාලනික, සමාජීය, විද්‍යාත්මක, ආගමික, භූගෝලීය හා සංස්කෘතික යනාදී විවිධ වූ විෂයන් හා අවියෝජනය වූවකි. ගීතය යනු සාහිත්‍යයේත් සංගීතයේත් මනා සුසංයෝගයකි. ගීතයක් මූලිකව ම නිර්මාණය වන්නේ ශබ්ද එක්වීමෙනි. ගීතයක ප්‍රධානත ම අංගය වශයෙන් පවතින රස ජනනය කරනු ලබන්නේ ද එම ශබ්ද මාධූර්යය මූලික කරගනිමිනි. ගීතයකට අන්තර්ගත කරනු ලබන පදමාලාව මගින් කරනු ලබන්නේ ද මෙම ශබ්ද රසය තීව්‍ර කිරීමයි. මෙලෙස බැලූ කල ප්‍රත්‍යක්ෂ වන්නේ ගීතය වනාහි සංගිතය තුළ එන ඉතා වැදගත් හා පෘථුල වූත්, පරිපූර්ණ වූත් කලා මධ්‍යයක් වන බව යි. එසේම ගීතය යන්න සංගීතය තුළ ප්‍රධානත ම භූමිකාවක් නියෝජනය කරගන්නා බව ද පැහැදිලි ය. ගීතයක් සාර්ථක වන්නේ එහි පදමාලාව, තනුව, වාදනය, ගායන විලාශය, ගායකයා, කටහඬ මෙන් ම වර්තමානයේ නම් රූප රචනය ආදී සියලු අංග නිවැරදි ව එකිනෙක හා ගැළපීම තුළින් ය. ඒ අනුව ගීතය තරුණ මනස ආකර්ෂණය කරගන්නා අයුරු පැහැදිලි කිරීම මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාවේ අරමුණ වේ.

ගීතයක් නිර්මාණයවීමෙහි ප්‍රථම පියවර එහි පද මාලාව යි. පසුව එයට තාලයක් නිර්මාණය වේ. නමුත් වර්තමානයේ දී මෙම සම්ප්‍රදායෙන් බැහැර ව බොහෝමයක් ගීත නිර්මාණය වනු දකගත හැකි ය. එනම් පළමු ව තනුව නිර්මාණය කරමින් පසුව එයට පදමාලාවන් යෙදීමයි. අවසාන වශයෙන් කටහඬ නිවැරදි ස්වරයේ පිහිටුවමින් ගායකයකු හෝ ගායිකාවක ලවා ගීතය ප්‍රාණවත් කිරීම නැතහොත් එයට ජීවයක් ලබා දීම සිදුකරයි. කෙසේ නමුත් මේ ආකාරයට නිර්මාණය වන ගීත අපගේ සවන් පත් පුරා රැව් පිළිරැව් දෙන විට අප උත්සහා ගන්නේ එය අපගේ පෞද්ගලික අත්දැකීමක් බවට පත්කර ගැනීමට හෝ පෞද්ගලික අත්දැකීම් හා සැසඳීමටයි.

කෙසේ නමුත් නූතනයේ බිහිවන බෝහෝ ගීත ඝෝෂාකාරී සංගිතයට නැකම් කියයි. කාලානුරූප ව වෙනස් වෙමින් ගීතයේ විවිධ ස්වරූප කරළියට පැමිණිය ද සමස්තයක් ලෙස ගත් කල සෑම පුද්ගලයකු ම තමාගේ පෞද්ගලික

---

1 තාවකාලික නිබන්ධක (දර්ශනය හා මනෝවිද්‍යාව), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, niromisa55@gmail.com

හෝ පොදු අත්දැකීමක් මුල් කරගනිමින් ලියවුණ ඇතැම් ගීත සමීප සබඳතා දක්වයි. එබැවින් සමස්තයක් ලෙස ගත් කල මිනිසා ගීතයත් සමග ඉතා සමීප සම්බන්ධතා පවත්වන බව නොරහසකි. ශ්‍රී ලාංකිකයන් පමණක් නොව සමස්ත ලොකයේ ම වෙසෙන ජනතාව දෙස බැලීමේ දී ඔවුන්ගෙන් 99% වඩා වැඩි ප්‍රතිශතයක් තමන්ගේ දෛනික කටයුතු අතරතුර අවම වශයෙන් ගීතයකට හෝ දෙකකට සවන්දීමට පුරුදු වී සිටි. එසේ නැත්නම් තමන්ට හුරු වූ ගීතයක් හෝ තම අත්දැකීමකට ඉතා සමීප ගීතයක් නිතර නිතර මිමිණීමට පුරුදුව සිටී.

ගීතය පිළිබඳ විවිධ අදහස් දක්වන විද්වතුන් විසින් ගීතය හඳුන්වා දෙන්නේ විශ්ව භාෂාවක් ලෙසිණි. මන්ද බොහෝ අවස්ථාවන් හි ගීතයේ අන්තර්ගත වචන මාලාව කුමන භාෂාවකින් ලිය වී තිබුණත් එහි වාච්‍යාර්ථය අමතක කර ශබ්ද රසය මුල්කර ගනිමින් ගීත රස විඳීමට මිනිසුන් පුරුදුව සිටීමයි. උදාහරණ ලෙස ලාංකිකයින් ඉංග්‍රීසි හා හින්දි භාෂාවල ගීත රසවිඳීමට රුචිකත්වයක් දැක්වීම පෙන්වාදිය හැකිය. මේ අනුව පැහැදිලි වන කරුණ නම් ගීතයක පවතින වාච්‍යාර්ථය පමණක් නොව එහි අනෙකුත් ගුණාංග මගින් පුද්ගලයා ගීතය කෙරෙහි ඇද බැඳ තබන බවයි.

කෙසේ වුවත් ලෝකයේ ජීවත් වන සෑම පුද්ගලයකුගේ ම ගීත රසවින්දනය එක හා සමාන නාවේ. පුද්ගලයාගෙන් පුද්ගලයාට රසන්දනයේ විසමතා පවතී. එක ම ගීතය වුව ද පුද්ගලයන් දෙදෙනෙකු විසින් එකිනෙකට වෙනස් ආකාරයට රසවින්දනය කරනු ලබන්නේ එබැවිනි. ඒ සඳහා මූලිකව ම හේතු කාරණා ගණනාවක් බලපෑ හැක. ඒ අතරින්,

1 පුද්ගලයන් අතර පවතින බුද්ධිමය විෂමතා
2 ඔවුන්ගේ පෞද්ගලික අත්දැකීම්වල ස්වරූපය
3 ඔවුන් ජීවත් වන සමාජ වටපිටාව
4 ඔවුන්ගේ වයස් සීමාවන් හා ස්ත්‍රී පුරුෂ භාවය
5 ඔවුන්ගේ කායික මානසික විසමතා

ගීත රසවින්දනයේ විසමතා වලට බලපාන ඉහත සාධක අතර ස්ත්‍රී පුරුෂ බවත්, ඔවුන්ගේ වයස් සීමාවන් අතර වෙනසත් මූලික වෙයි. වයස් භේදයකින් තොරව ගීත රස විඳීමට සියලු දෙනා ප්‍රිය කළත් ඉන් වඩාත් සුලභ සමාජ කොට්ඨාසය තරුණ පිරිස ය. තරුණයින් යනු ආවේගශීලී, ආක්‍රමණශීලී මෙන් ම නව අදහස් ආකල්ප ඉක්මනින් වැළඳ ගන්නා පිරිසකි. ඒ අනුව ගීතය තරුණ මනසට කෙබඳු බලපෑමක් සිදුකරන්නේ ද යන්න නිශ්චය කරගැනීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ යි.

තෝරාගත් නියැදිය තුළ සිදුකරන ලද පර්යේෂණයට අනුව තරුණ තරුණියන් විසින් ඔවුන් තුළ පවතින විවිධ හැඟීම් සමුදායන් මෙන් ම මුවින් පැවසිය නොහැකි හැඟීම් දැනීම් සන්නිවේදනය කරන සන්නිවේදන මාධ්‍යයක් ලෙසත්, බොහෝ කායික මානසික පීඩාවන්ට පත්ව සිටින අවස්ථාවන්හිදී සිතට

සැනසුම වින්දනය හා සතුට ලබාදෙන මූලාශ්‍රයක් ලෙසත්, විවිධ භාවයන් ප්‍රකාශ කරන භාව ප්‍රකාශන මාධ්‍යයක් ලෙසත්, මානසික ඒකග්‍රතාව හා අහිතකර චිත්තවේග පාලනයට උපකාර වන උපකාර ක්ෂේත්‍රයක් ලෙසත්, ආකල්ප සංශෝධනයට ඉවහල් වන ප්‍රබල සාධකයන් ලෙසත්, කායික මානසික දෙඅංශයේ දී භාවිත කළ හැකි සාර්ථක ප්‍රතිකාරාත්මක ක්‍රමවේදයක් ලෙසත්, තරුණ මනසට ගීතය ධනාත්මක ලෙස බලපෑම් කරන බව මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් හඳුනා ගැනීමට හැකි විය.

මෙම තෝරා ගැනීමට සුභාවිත ගීතයත් අසංයත ගීතයත් ලෙසට යෙදා වර්ගීකරණය කර නොමැති අතර එසේ කිරීමට ප්‍රධානතම හේතුව වූයේ ගීතය පෞද්ගලික මායිම් තුළ දී එකිනෙකාට වෙනස් හැඟීම් ජනිත කරවීමයි.

**නිගමනය**

වර්තමාන සමජය දෙස අවධානය යොමුකිරීමේ දි ගීතය තරුණ මනසට ධනාත්මක බලපෑම් කරන අතර ම ඒ තුළින් තරුණ මනස උද්දීපනයට ලක්කරයි. එමෙන් ම ඇතැම් ගීත අපගේ මනස සම්පූර්ණයෙන් ම උඩු යටිකුරු කිරීමට සමත් වන බව ද ප්‍රත්‍යක්ෂ විය. ඒ අනුව ඇතැම් ගීත තරුණ මනස තුළ පවතින තරුණ ජවය උදාසීන කරන, ස්වයං ගෞරවය හීන කරන, ධනාත්මක පෞරුෂත්වයන්ට බාධා පමුණුවන ආකාරයේ සිතුවිලි ජනිත කරන, බුද්ධිමය චින්තනය මොට කරන පුද්ගලයා හැඟීම්වලට සෘණාත්මක බලපෑම් සිදුවන බව අවබෝධ කර ගැනීමට හැකි විය. ඒ අනුව සෘණාත්මකව ගොඩනැගෙන තරුණ ජීවිත මනෝවිද්‍යාත්මක නිවැරදි මාර්ගයට පැමිණවිය හැකි ය.

**ප්‍රමුඛපද**: ගීතය, මනස, රසවින්දනය, තාරුණ්‍යය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගලප්පත්ති, බුද්ධදාස, (2011). සුභාවිත ගීතයේ නන්දා සුසංයෝගය, රසවිත, කොළඹ: විජය ප්‍රකාශකයෝ.

හේරත්, සමන්ත, (1999). ගීත විචාර සංහිතා, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්දසේන, (1999). නූතන සින්දු සාහිත්‍යය, කොළඹ: සදීපා ප්‍රකාශන.

මුණසිංහ, චාමික, (2008). සිංහල ගීතයේ නූතන ප්‍රවණතා, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.